සැ. යු. - 2022.07.01 දින පළ කරන ලද අංක 2287 ගැසට් පත්‍රයේ III හා IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,288 - 2022 ජූලි මස 08 වැනි සිකුරාදා - 2022.07.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1082 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) සමාජ ආරක්ෂණ දයකත්ව බදු පනත් කෙටුම්පත 2022 ජුනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජුනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) කාර්මික ආරාවුල් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජුනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 15 වැනි දින දහවල් 12.0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## දික්වැල්ල ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

දික්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ පෙබරවාරි මස 22 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 5.1.7 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කිත්සර මුතුකුමාරණ,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 18 වැනි දින,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දික්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් පහතින් දක්වා ඇති A සිට G දක්වා ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

A ප්‍රදේශය

වලස්ගල කුමාර ස්ටෝර්ස් හන්දියේ සිට මාතර දෙසට රදම්පල හන්දිය දක්වා 4.2 km දුරැති දික්වැල්ල රදම්පල හරහා මාතර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට නැගෙනහිරට හා බටහිරට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමද

B ප්‍රදේශය

බතීගම රෝහල හන්දිය සිට මාතර දෙසට බෙලිවත්ත සීතගල්ල (ප්‍රාදේශීය සභා සීමාව) දක්වා 6.940 km දුරැති දික්වැල්ල මාතර ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දකුණට හා උතුරට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමද

C ප්‍රදේශය

දොඩම්පහල ලහිරු හාල්මෝල සිට තංගල්ල දෙසට නිල්වැල්ල හන්දිය (ප්‍රාදේශීය සභා සීමාව) දක්වා 3.01km දුරැති දික්වැල්ල මහවෙල හරහා තංගල්ල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට උතුරට හා දකුණට 100m දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමද

D ප්‍රදේශය

නිල්වැල්ල ඕකිඩ්විලා සංචාරක නවාතැන්පල සිට නිල්වැල්ල දෙසට වරාය හන්දිය දක්වා 1.550km දුරැති දික්වැල්ල නිල්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට වයඹට හා ගිණිකොණට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමද

E ප්‍රදේශය

වැලිහිටිය සිරිසුමන මාවතේ දැනට වරිපනම් පනවා ඇති සීමාවේ සිට (බුදු පිළිමය අසළ සිට) අලුත්ගොඩ දෙසට සියඹලාගහ හන්දිය දක්වා 1km දුරැති වැලිහිටිය අලුත්ගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට උතුරට හා දකුණට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම ද

F ප්‍රදේශය

මාර/දික්වැල්ල මෙතෝදිස්ත විදුහල හන්දිය සිට මුහුදු වෙරළ දෙසට 750m දුරැති දික්වැල්ල හිරිකැටිය මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට උතුරට හා දකුණට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමද

G ප්‍රදේශය

පෙහෙඹිය පාර ද වර්ස් සංචාරක නිකේතනය සිට මුහුදු වෙරළ දෙසට 1.120km දුරැති දික්වැල්ල පෙහෙඹිය මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ඊසානට හා නිරිතට 100m ක් දක්වා පිහිටි සියලුම නිශ්චල දේපළ ඇතුළත් භූමිය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

07-74

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.